AL/2018/18-S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2018**

**2018.08.14 / 1300 - 1500**

| | | | |
|---|---|---|---|
| **කෘෂි තාක්ෂණවේදය** I<br>விவசாயத் தொழினுட்பவியல் I<br>Agro Technology I | **18** | **S** | **I** |

*පැය දෙකයි*
*இரண்டு மணித்தியாலம்*
*Two hours*

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** මෘදු තාක්ෂණයේ ඓතිහාසික විකසනයෙන් වඩාත් ප්‍රතිලාභ ලබා ඇති කර්මාන්තය තෝරන්න.
(1) විදුලි සංදේශ කර්මාන්තය
(2) අභ්‍යන්තර ප්‍රවාහන කර්මාන්තය
(3) ආහාරපාන කර්මාන්තය
(4) සෞඛ්‍ය සත්කාර කර්මාන්තය
(5) පුනර්ජනනීය බලශක්ති කර්මාන්තය

**2.** පැතුරුම්පත් (spread sheet) භාවිතය වඩාත් යෝග්‍ය වන්නේ,
(1) ගැනුම්කරුවන් සඳහා ඉදිරිපත් කිරීමක් (presentation) පිළියෙල කිරීමට ය.
(2) දැනුම බෙදාහැරීම පිණිස වූ ලියවිල්ලක් සැකසීමට ය.
(3) සමාගමක් නිෂ්පාදනය කරන එක් එක් අයිතමයක ලාභය ගණනය කිරීමට ය.
(4) පාරිභෝගිකයන් පිළිබඳ විස්තර පවත්වා ගැනීමට ය.
(5) සමාගමෙහි පැතිකඩ දත්ත පවත්වා ගැනීමට ය.

**3.** අධිපෝෂණය නිසා ඇති විය හැකි තත්ත්වයන් වන්නේ,
(1) අධිරුධිර පීඩනය සහ පිළිකා ය.
(2) දියවැඩියාව සහ රක්තහීනතාවය ය.
(3) ස්ථුලතාවය සහ මානසික අවපීඩනය ය.
(4) ස්ථුලතාවය සහ අධිරුධිර පීඩනය ය.
(5) ස්ථුලතාවය සහ පිළිකා ය.

**4.** ගර්භනී කාලයේ දී නිරෝගී කලල වර්ධනයක් සඳහා වඩාත් වැදගත් විටමිනය වන්නේ,
(1) සයනොකොබැලමින් ය.
(2) රයිබොෆ්ලේවින් ය.
(3) ෆෝලික් අම්ලය ය.
(4) පිරිඩොක්සින් ය.
(5) බයොටීන් ය.

**5.** මුදුවීම අවම කිරීම සඳහා ක්‍රියාකාරිත්වය පාලනය කළ යුතු එන්සයිමය වන්නේ
(1) පෙරොක්සිඩේස් ය.
(2) ලයිපේස් ය.
(3) පොලිෆීනෝල් ඔක්සිඩේස් ය.
(4) පෙක්ටිනේස් ය.
(5) කැටලේස් ය.

**6.** ආහාරයක පෝෂක ප්‍රමාණයට සහ එය ක්ෂුද්‍රජීවීන් මගින් අපවිත්‍රණය වීමට අදාළ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - ක්ෂුද්‍රජීවීන් මගින් අපවිත්‍රණය වීම නිසා ආහාරයක පෝෂක සුලභතාවය වෙනස් වේ.
B - ක්ෂුද්‍රජීවීන් මගින් අපවිත්‍රණය වීම නිසා සැමවිටම ආහාරයක පෝෂක ප්‍රමාණය වැඩි වේ.
C - වැඩි පෝෂක ප්‍රමාණයක් අඩංගු ආහාර, ක්ෂුද්‍රජීවී අපවිත්‍රණයට වැඩි නැඹුරුවක් දක්වයි.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A හා C පමණි.
(5) B හා C පමණි.

[දෙවැනි පිටුව බලන්න.

**7.** ජාතික ආහාර සුරක්ෂිතතාවයට **ඍණාත්මකව** බලපාන්නේ,
(1) සැකසූ ආහාර ප්‍රතිඅපනයනය කිරීමයි.
(2) ආහාර බෝගවල පසු අස්වනු හානිය අඩු කිරීමයි.
(3) සහල් මත පදනම් වූ විවිධාංගීකරණය කළ ආහාර නිෂ්පාදනයයි.
(4) වැඩි අස්වනු ආහාර බෝග හඳුන්වාදීමයි.
(5) ජනගහන වර්ධනයයි.

**8.** සමහර ශාක විශේෂයන්හි බීජ ප්‍රරෝහණය ආරම්භවීම සහ මල් පිපීම සඳහා වසන්තීකරණය කිරීම වැදගත් පියවරකි. වසන්තීකරණය යන්න පැහැදිලි කළ හැක්කේ බීජ හෝ බීජ පැළ
(1) අඛණ්ඩ වියළි කාලයකට සහ අනතුරුව ක්ෂණික තෙත් තත්ත්වයකට පත් කිරීම ලෙස ය.
(2) 10 °C ක් පමණ වූ අඛණ්ඩ සිසිල් කාලයකට පත් කිරීම ලෙස ය.
(3) අඛණ්ඩව දිගු දිවා කාලයකට නිරාවරණය කර තැබීම ලෙස ය.
(4) අඛණ්ඩව කෙටි දිවා කාලයකට නිරාවරණය කර තැබීම ලෙස ය.
(5) මාරුවෙන් මාරුවට වියළි සහ තෙත් කාලවලට නිරාවරණය කිරීම ලෙස ය.

**9.** පාංශු ජලය පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.
A - ගුරුත්වාකර්ෂක ජලය මහා අවකාශවල රැඳෙන අතර කේශාකර්ෂක ජලය ක්ෂුද්‍ර අවකාශවල රැඳේ.
B - ගුරුත්වාකර්ෂක සහ කේශාකර්ෂක යන දෙයාකාරයේම ජලය පසට ලිහිල්ව බැඳී ඇති අතර, ශාකවලට ලබාගත හැක.
ඉහත ප්‍රකාශ අතුරෙන්,
(1) A පමණක් නිවැරදි ය.
(2) B පමණක් නිවැරදි ය.
(3) A සහ B දෙකම නිවැරදි ය.
(4) A සහ B දෙකම නිවැරදි අතර A මගින් B වඩාත් පැහැදිලි කරයි.
(5) A සහ B දෙකම නිවැරදි අතර B මගින් A වඩාත් පැහැදිලි කරයි.

**10.** පහත තත්ත්වයන් සලකන්න.
A - ජෛව විවිධත්වය වැඩි වීම.
B - ප්‍රචාරක අවයව සංඛ්‍යාව වැඩි වීම.
C - රෝග පැතිරීම අඩු වීම.
D - දෙමුහුම් (hybrid) දිරිය අඩු වීම.
ඉහත තත්ත්වයන් අතුරෙන් අලිංගික ප්‍රචාරණයට සාපේක්ෂව, ලිංගික ප්‍රචාරණයේ ඇති වාසි වන්නේ,
(1) A සහ B පමණි. (2) B සහ C පමණි. (3) C සහ D පමණි.
(4) A, B සහ C පමණි. (5) B, C සහ D පමණි.

**11.** ශ්‍රී ලංකාවේ පාංශු ජීවානුහරණය කිරීම සඳහා භාවිතයට ගැනීම තහනම් කර ඇති රසායනික ද්‍රව්‍ය වන්නේ,
(1) ග්ලයිෆොසේට් ය. (2) මීතයිල් බ්‍රෝමයිඩ් ය.
(3) මොනොක්‍රොටපොස් ය. (4) කැප්ටාන් ය.
(5) පැරකොට් ය.

**12.** ගිබරලික් අම්ලය යනු,
(1) බාහිර ශාක වර්ධක යාමකයකි.
(2) බීජ ප්‍රරෝහණ නිශේධක හෝමෝනයකි.
(3) ශාක සහ දිලීර තුළ ඇති හෝමෝනයකි.
(4) එළදායි වල් නාශකයකි.
(5) ද්විතීයික බීජ සුප්තතාවය ප්‍රේරණය කරන එන්සයිමයකි.

**13.** පාවට්ටා (*Adhatoda vasica*) කසාය භාවිත කරන්නේ පහත සඳහන් කුමන රෝග තත්ත්ව සමනය කිරීම සඳහා ද?
(1) වමනය (2) කැස්ස සහ සෙම්ප්‍රතිශ්‍යාව (3) පාචනය
(4) අතිමධුරක්තිය (5) අධිරුධිර පීඩනය

**14.** බීජ, දඬු කැබලි, මොරෙයියන් සහ රයිසෝම මගින් ප්‍රචාරණය කරන ඖෂධ පැළ වර්ග වලට උදාහරණ වන්නේ පිළිවෙළින්,
(1) කොහොඹ, පාවට්ටා, කෝමාරිකා සහ අමුකහ වේ.
(2) කෝමාරිකා, කොහොඹ, පාවට්ටා සහ ඉඟුරු වේ.
(3) පාවට්ටා, කෝමාරිකා, කොහොඹ සහ අමුකහ වේ.
(4) හාතාවාරිය, කෝමාරිකා, පාවට්ටා සහ ඉඟුරු වේ.
(5) කෝමාරිකා, හාතාවාරිය, පාවට්ටා සහ අමුකහ වේ.

[තුන්වැනි පිටුව බලන්න.

15. ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය තිරසාරව වැඩිදියුණු කිරීම සඳහා අනුගමනය කරන එක් ක්‍රමයක් වන්නේ අභ්‍යන්තර ජලාශවලට මත්ස්‍ය පැටව් මුදාහැරීමයි. මත්ස්‍ය පැටව් මුදාහැරීම කරනු ලබන්නේ,
(1) සී-නෝර් පදනම මගිනි.
(2) ජාතික ජලජීවී සංවර්ධන අධිකාරිය මගිනි.
(3) ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන ආයතනය මගිනි.
(4) ධීවර සමූපකාර සමිති මගිනි.
(5) ධීවර දෙපාර්තමේන්තුව මගිනි.

16. මුහුදු තෘණ භූමි යනු ලෝකයේ ඇති සංවේදී ජලජ පාරිසරික පද්ධතිවලින් එකකි. මුහුදු තෘණ භූමි හා සමීප සම්බන්ධතාවකින් ජීවත්වන මුහුදු සත්ත්ව විශේෂයක් වන්නේ,
(1) මෝරා ය. (2) තල්මසා ය. (3) මඩුවා ය.
(4) කැස්බෑවා ය. (5) දැල්ලා ය.

17. වියළීම යනු ආහාර පරිරක්ෂණ ක්‍රමයකි. වියලූ ආහාර පරිරක්ෂණය වන්නේ,
(1) බර අඩුවීම නිසා ය.
(2) නරක්වීම සඳහා අවශ්‍ය කරන ජලය සුලබ නොවීම නිසා ය.
(3) වියළීමේදී රත් කිරීම නිසා ය.
(4) වියළීමේ දී අධික උෂ්ණත්වය නිසා විෂබීජ විනාශවන නිසා ය.
(5) ගබඩා තුළ ඇති අඩු උෂ්ණත්වය නිසා ය.

18. නැවුම් එළවළු කෙටි කාලීනව ගබඩා කර තබාගැනීම සඳහා සුදුසු පාරිසරික තත්ත්ව වන්නේ,
(1) වැඩි උෂ්ණත්වය හා වැඩි ආර්ද්‍රතාවය ය.
(2) වැඩි ඔක්සිජන් සහ අඩු උෂ්ණත්වය ය.
(3) අඩු කාබන්ඩයොක්සයිඩ් සහ අඩු ආර්ද්‍රතාවය ය.
(4) අඩු උෂ්ණත්වය සහ වැඩි ආර්ද්‍රතාවය ය.
(5) අධිශීත උෂ්ණත්වය සහ අඩු ආර්ද්‍රතාවය ය.

19. පාරම්පරික (පැරණි) ජෛව තාක්ෂණය යොදාගැනීම සඳහා උදාහරණයක් වන්නේ,
(1) ජාන විකරණය කළ තක්කාලි නිෂ්පාදනය ය.
(2) Bg 360 (කීරි සම්බා) සහල් ප්‍රභේදය නිෂ්පාදනය ය.
(3) DNA විශ්ලේෂණය මගින් පුද්ගලයන් හඳුනාගැනීම ය.
(4) ලුණුදෙහි නිෂ්පාදනය කිරීම ය.
(5) වියළීම සහ දුම්ගැසීම මගින් මස් පරිරක්ෂණය කිරීම ය.

20. අලුත් සතුන් සහ නව තාක්ෂණය හඳුන්වාදීමෙන් වාණිජ කිරි නිෂ්පාදකයෙකු තම ගොවිපොළෙහි නිෂ්පාදනය වැඩි කර ගත් අතර වැඩි ලාභයක් උපයා ගත්තේ ය. ඉහත ක්‍රියාකාරකම තුළින්
(1) ඔහුගේ පුද්ගලික ලාභ ප්‍රයෝජන පමණක් වැඩි විය.
(2) වැඩි ලාභයක් ලබාගන්නා අතරම ජාතික කිරි නිෂ්පාදනය වැඩි කිරීමට දායක විය.
(3) පරිභෝජනය සඳහා වැඩිපුර කිරි සපයමින් ප්‍රදේශයේ ජනතාවට උපකාර විය.
(4) කිරිගව ගොවිපොළ පුළුල් කිරීම මගින් පාරිසරික බලපෑම් වැඩි විය.
(5) රට තුළ කිරි නිෂ්පාදනය සඳහා ඇති විභවය විදහා දැක්විය.

21. ව්‍යවසායකයෙකු සම්බන්ධයෙන් පහත දක්වා ඇති ප්‍රකාශ සලකන්න.
A - නිතරම නම්‍යශීලීයි.
B - ආත්ම විශ්වාසයකින් යුක්ත වේ.
C - අන් අයගේ අදහස් අනුව තීරණ ගනී.
D - තමාගේ කාර්යයන්වලට කැප වේ.
ඉහත ප්‍රකාශ අතුරින් සාර්ථක ව්‍යවසායකයකු සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,
(1) A, B සහ C පමණි. (2) A, B සහ D පමණි. (3) A, C සහ D පමණි.
(4) B, C සහ D පමණි. (5) C සහ D පමණි.

22. අවන්හල් හිමියෙක් අවන්හල තුළ ආහාර පාන සැපයීමට අමතරව ආහාර පාර්සල් කර විකිණීම ආරම්භ කළේ ය. මෙම ව්‍යාපාරයේ සියලු කටයුතු අවම යන්ත්‍රසූත්‍ර භාවිතයෙන් මිනිස් ශ්‍රමය යොදා සිදු කළේ ය. ඉහත සඳහන් ව්‍යාපාරය,
(1) ප්‍රාග්ධන සූක්ෂම, සේවා අරමුණු කර ගත් එකකි.
(2) ශ්‍රම සූක්ෂම, සේවා අරමුණු කර ගත් එකකි.
(3) ශ්‍රම සූක්ෂම, වෙළඳාම අරමුණු කර ගත් එකකි.
(4) ප්‍රාග්ධන සූක්ෂම, වෙළඳාම අරමුණු කර ගත් එකකි.
(5) ශ්‍රම සූක්ෂම, නිෂ්පාදන සහ සේවා අරමුණු කර ගත් එකකි.

[හතරවැනි පිටුව බලන්න.

EXAMMOOD.LK EXAMMOOD.LK

**23.** කෘෂි ව්‍යාපාරයක ප්‍රාග්ධන වියදම්වලට ඇතුළත් වන්නේ,
(1) වැටුප්, පොහොර සඳහා වූ පිරිවැය සහ ඇසුරුම් ද්‍රව්‍ය සඳහා වූ පිරිවැය ය.
(2) මිලදීගත් යන්ත්‍රසූත්‍රවල වටිනාකම සහ ඒවායේ නඩත්තු වියදම් ය.
(3) ඉසින යන්ත්‍ර, ඇඹරුම් යන්ත්‍ර සහ ඇසුරුම් යන්ත්‍රවල වටිනාකම ය.
(4) ගොඩනැගිලි සහ මාර්ග පද්ධතිවල නඩත්තු වියදම් ය.
(5) ගොඩනැගිලි ක්ෂයවීම, ඉන්ධන පිරිවැය සහ විදුලි ගාස්තු ය.

**24.** තීව්‍ර ආහාර නිෂ්පාදනය නිසා පරිසරය දූෂණය වීමට ඇති අවදානම අඩු කරගැනීමට වඩාත් සුදුසු ක්‍රමය වන්නේ,
(1) කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතයෙන් වැළකී සිටීම ය.
(2) ආහාර පරිභෝජනය අවම කිරීම ය.
(3) පාරම්පරික කෘෂිකාර්මික ක්‍රම ප්‍රචලිත කිරීම ය.
(4) උචිත තාක්ෂණය යොදාගැනීම ය.
(5) පරිසර ප්‍රකෘති කිරීමේ තාක්ෂණය දියුණු කිරීම ය.

**25.** ශ්‍රී ලංකාවේ භාවිත වන ජීව වායු නිෂ්පාදන මාදිලි තුනක් පහත දැක්වේ.
A - චීන මාදිලිය
B - ඉන්දියානු මාදිලිය
C - ශ්‍රී ලංකා මාදිලිය
ඉහත මාදිලි අතුරෙන්, කුඩා පරිමාණ කිරි ගව ගොවිපොළක් සඳහා වඩාත් උචිත වන්නේ,
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) B සහ C පමණි.

**26.** හරිත විප්ලවය ප්‍රධාන වශයෙන් ඉලක්ක වූයේ,
(1) ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම කෙරෙහි ය.
(2) කෘෂිකර්මය ආර්ථිකව තිරසාර කිරීම කෙරෙහි ය.
(3) කෘමිනාශක සහ රසායනික පොහොර භාවිතය වැඩි කිරීම කෙරෙහි ය.
(4) බෝගවල ඵලදායිතාවය ඉහළ දැමීම කෙරෙහි ය.
(5) කාබනික ගොවිතැන හඳුන්වාදීම සහ ජනප්‍රිය කිරීම කෙරෙහි ය.

**27.** පසක පහත දැක්වෙන තත්ත්ව සලකා බලන්න.
A - පාංශු ඛාදනය අඩු වීම.
B - පාංශු සුසංහනය වැඩි වීම.
C - පසට ජලය කාන්දුවීම වැඩි වීම.
D - කාබනික ද්‍රව්‍ය වියෝජනය වැඩි වීම.
ඉහත තත්ත්ව අතුරෙන් අවම බිම් සැකසීමේ වාසි වන්නේ,
(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) C සහ D පමණි.
(4) A, B සහ C පමණි. (5) B, C සහ D පමණි.

**28.** අතුරුයත්ගෑම මගින්,
(1) බෝග අස්වැන්න අඩු වේ.
(2) පාංශු ඛාදනය අඩුවේ.
(3) වල්පැළවල තරඟකාරිත්වය වැඩි වේ.
(4) පළිබෝධ පාලනය සිදු වේ.
(5) පෝෂක අවප්‍රමාණ වීම (depletion) වැඩි වේ.

**29.** නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) SALT ක්‍රමය (Sloping Agricultural Land Technology) භූමි ඵලදායිතාවය අඩු කරයි.
(2) ආවරණ බෝගයක් ලෙස පියුරේරියා භාවිතය, පොල් ශාකයේ මූල වර්ධනයට අහිතකර ලෙස බලපායි.
(3) පසට ඩොලමයිට් යෙදීම පාංශු pH අඩු කිරීමට උපකාරී වේ.
(4) තෙත් කලාපය හා සැසඳීමේදී වියළි කලාපීය පස්වල ලවණතාවය ගොඩනැගීම ඉහළ වේ.
(5) පාංශු pH අගය වැඩිවීම පෝෂක රඳවාගැනීම ඉහළ දමයි.

**30.** පසක pH අගය මගින් ගම්‍ය වනුයේ,
(1) පාංශු ප්‍රතික්‍රියාව යි.
(2) පාංශු ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වය යි.
(3) පසක පාංශු කලිල ද්‍රව්‍ය මට්ටම යි.
(4) පසක සෝඩියම් අයන ප්‍රමාණය යි.
(5) පසක කැටායන හුවමාරු ධාරිතාවය යි.

[පස්වැනි පිටුව බලන්න.

EXAMMOOD.LK

**31.** විසුරුම් ජලසම්පාදනය
(1) යොදාගැනීමට නම්, බෝග පේළි වශයෙන් සංස්ථාපනය කළ යුතු ය.
(2) මිශ්‍ර බෝග වගාවන් සඳහා පමණක් යොදාගත හැකි වේ.
(3) බෝග ක්ෂේත්‍රය ඒකාකාරී ලෙස තෙත් කරනු ලබයි.
(4) රෝග හා පළිබෝධ අවස්ථා වැඩි කරයි.
(5) බෑවුම් සහිත ප්‍රදේශවල ඇති බෝග සඳහා යෝග්‍ය නොවේ.

**32.** පහත සඳහන් ද අතුරින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) ක්ෂේත්‍ර ධාරිතාවයට වඩා බෙහෙවින් පහළ මට්ටමකට වාරි ජලය සැපයිය යුතු ය.
(2) ජල සංරක්ෂණ ක්‍රම, ශාකවල උත්ස්වේදනය වැඩි කරයි.
(3) වර්ෂා ජලයෙන් උපරිම ප්‍රයෝජන ලබාගැනීම සඳහා බෝග සංස්ථාපනය සැලසුම් කළ යුතු ය.
(4) අර්තාපල් වගාවක් සඳහා ජලය සැපයීමට යෝග්‍යතම ක්‍රමය උපපෘෂ්ඨීය ජලසම්පාදනයයි.
(5) උපපෘෂ්ඨීය ජල සම්පාදනය, වගා ක්ෂේත්‍රයක වාෂ්පීකරණ හානි වැඩි කරයි.

**33.** සමතුලිත ශාක පෝෂක සැපයීම
(1) පාංශු ඵලදායිතාවය පවත්වා ගැනීමට උපකාරී වේ.
(2) පොහොර භාවිතය අඩු කිරීමට උපකාරී වේ.
(3) පළිබෝධ නාශක භාවිතය අවම කිරීමට උපකාරී වේ.
(4) පාංශු ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීමට උපකාරී වේ.
(5) භූමි හායනය අඩු කිරීමට උපකාරී වේ.

**34.** පහත ද සලකා බලන්න.
A - පොහොර ආකාරය
B - ශාකයේ වර්ධන අවධිය
C - ශාකයේ පෝෂක අවශෝෂණ කාර්යක්ෂමතාවය
D - ශාක කුලය
ඉහත ලක්ෂණ අතුරෙන්, ශාකයකට පොහොර සැපයීමේදී සලකා බැලිය යුතු ලක්ෂණ වන්නේ,
(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) B සහ C පමණි.
(4) C සහ D පමණි. (5) A, B සහ C පමණි.

**35.** බෝගයක පොහොර භාවිත කාර්යක්ෂමතාවය වර්ධනය කළ හැක්කේ,
(1) අධික ප්‍රමාණවලින් පොහොර භාවිතය මගිනි.
(2) පොහොර මිශ්‍රණ වශයෙන් යෙදීම මගිනි.
(3) පස මතුපිටට පොහොර යෙදීම මගිනි.
(4) පොහොර යෙදීමට පෙර වල් පැළ මර්දනය කිරීම මගිනි.
(5) පොහොර යෙදීමෙන් පසුව ක්ෂේත්‍රයට ජලසම්පාදනය කිරීම මගිනි.

**36.** කුඹුරුවල සුලබ පත් වර්ගයේ වල් පැළ වන්නේ,
(1) තුනැස්ස (*Cyperus iria*), වෙල්හිරිය (*Cyperus esculentus*) සහ කුඩමැට්ට (*Fimbristylis miliacea*)
(2) කලාදුරු (*Cyperus rotundus*), ඇලිගේටර් වල්පැළෑටිය (*Alternanthera philoxeroides*) සහ වෙල්මාරුක් (*Echinochloa crus-galli*)
(3) තුනැස්ස (*Cyperus iria*), කුඩමැට්ට (*Fimbristylis miliacea*) සහ වෙල්මාරුක් (*Echinochloa crus-galli*)
(4) වෙල්හිරිය (*Cyperus esculentus*), ඇලිගේටර් වල්පැළෑටිය (*Alternanthera philoxeroides*) සහ කලාදුරු (*Cyperus rotundus*)
(5) කුඩමැට්ට (*Fimbristylis miliacea*), වෙල්මාරුක් (*Echinochloa crus-galli*) සහ ඇලිගේටර් වල් පැළෑටිය, (*Alternanthera philoxeroides*)

**37.** ශාකයක පහත සඳහන් වර්ධක අවස්ථා සලකන්න.
A - බීජ ප්‍රරෝහණය
B - වර්ධක වර්ධනය
C - ප්‍රජනක වර්ධනය
D - පරිණත අවධිය
ඉහත අවස්ථා අතුරෙන් පොස්පරස් වඩාත්ම අවශ්‍ය වර්ධක අවස්ථා වන්නේ,
(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) B සහ C පමණි.
(4) B සහ D පමණි. (5) C සහ D පමණි.

**38.** පටක රෝපිත ශාක සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පළිබෝධ ආසාධනවලින් තොරයි.
(2) වසර පුරා ප්‍රචාරණය කළ හැක.
(3) බීජ මගින් ප්‍රචාරණය වන ශාකවලට වඩා වේගයෙන් වර්ධනය වේ.
(4) බීජ මගින් ප්‍රචාරණය වන ශාකවලට වඩා ඉහළ අස්වැන්නක් ලබා දේ.
(5) බීජ මගින් ප්‍රචාරණය වන ශාකවලට වඩා අඩු වියදමකින් නිපදවා ගත හැක.

**39.** කෘමීන් පිළිබඳ පහත ප්‍රකාශ සලකා බලන්න.
A - පියාඹීමට හැකි එකම සන්ධිපාදිකයින් කොට්ඨාශයයි.
B - තණකොළ-පෙත්තන් පූර්ණ රූපාන්තරණය සිදුකරයි.
C - දළඹුවන්, විදීමේ සහ උරාබොන මෞඛ උපාංග දරයි.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) B සහ C පමණි.

**40.** ශ්‍රී ලංකාවේ දැකිය හැකි නිදහසේ පාවෙන ජලජ පැළෑටි සඳහා උදාහරණ වන්නේ,
(1) සැල්වීනියා, ජපන් ජබර සහ දිය හවරිය (Pistia) වේ.
(2) පාතීනියම්, සැල්වීනියා සහ ගඳපාන වේ.
(3) ජපන් ජබර, ගඳපාන සහ යෝධ නිදිකුම්බා වේ.
(4) දිය හවරිය, වෙල්මාරුක් සහ ගඳපාන වේ.
(5) වෙල්මාරුක්, පාතීනියම් සහ සැල්වීනියා වේ.

**41.** පහත සඳහන් ශාක රෝග සලකා බලන්න.
A - ඇන්ත්‍රැක්නෝස්
B - දියමලන්කෑම
C - මෘදු කුණුවීම
D - පත්‍ර පුල්ලි රෝගය
E - පූර්ව අංගමාරය
ඉහත රෝග අතුරෙන් දිලීර රෝග වන්නේ,
(1) A, B සහ C පමණි. (2) A, B සහ E පමණි. (3) B, C සහ D පමණි.
(4) B, C සහ E පමණි. (5) C, D සහ E පමණි.

**42.** ශ්‍රී ලංකාවේ විසිතුරු මල් කර්මාන්තය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ජපානය වෙත මල් සපයන විශාලතම අපනයනකරුවා ශ්‍රී ලංකාවයි.
(2) විවෘත ක්ෂේත්‍ර තත්ත්ව යටතේ වවන මල් සඳහා ඉහළම අපනයන ඉල්ලුම පවතී.
(3) ඇන්තූරියම්, රෝස සහ බිනර ප්‍රධාන වශයෙන් අපනයනය කරනු ලබන්නේ ශ්‍රී ලංකාවයි.
(4) කැපූ මල්, සීනි ද්‍රාවණයක ගිල්වීමෙන් ඒවායේ ජීවකාලය වැඩි වේ.
(5) කැපූ මල් අපනයනයේදී ජල කුප්පි භාවිතය තහනම් ය.

**43.** නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ජර්බෙරා ප්‍රචාරණය කරනු ලබන්නේ බීජ සහ රයිසෝම මගිනි.
(2) ඕකිඩ් ප්‍රචාරණය කරනු ලබන්නේ බීජ සහ මුල් මගිනි.
(3) බිගෝනියා ප්‍රචාරණය කරනු ලබන්නේ බීජ සහ රයිසෝම මගිනි.
(4) ඇන්තූරියම් ප්‍රචාරණය කරනු ලබන්නේ මොරෙයියන් සහ රයිසෝම මගිනි.
(5) රෝස ප්‍රචාරණය කරනු ලබන්නේ මුල් සහ කඳ කැබලි මගිනි.

**44.** පහත ද සලකන්න.
A - විශාල පත්‍ර
B - දිග අන්තර් පර්ව
C - කප්පාදුවට ඔරොත්තු දීම
ඉහත ලක්ෂණ අතුරෙන් ශාක වැටි සඳහා සුදුසු ශාකවල තිබිය යුතු ගති ලක්ෂණය/ලක්ෂණ වන්නේ,
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) B සහ C පමණි.

**45.** පහත දැක්වෙන්නේ උද්‍යානයකට අවශ්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම් සමහරකි.

A - ජල සම්පාදනය
B - ව්‍යුහ පුනරුත්ථාපනය
C - ශාක පුහුණු කිරීම
D - පින්තාරු කිරීම

ඉහත ඒවා අතුරෙන් උද්‍යානයක මෘදු සංරචකවලට අත්‍යවශ්‍ය කළමනාකරණ අංග වන්නේ,

(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) A සහ D පමණි.
(4) B සහ C පමණි. (5) C සහ D පමණි.

**46.** ගොවිපළ සත්ත්ව නිෂ්පාදනය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ලාජ්වයිට් යනු මස් සඳහා ඇති කරනු ලබන කුකුළු වර්ගයකි.
B - ධාන්‍ය සහ තෘණ දෙවර්ගයේම අඩංගු ප්‍රධාන පෝෂණ සංඝටකය කාබෝහයිඩ්‍රේට වේ.
C - සාන්ද්‍රාහාරයක අඩංගු විය හැකි උපරිම දළ තන්තු ප්‍රමාණය 20% කි.
D - කිකිළියකගේ ආහාර සලාකයට සුදුසු වර්ණක එක් කිරීම මගින් බිත්තරයක කහ මදයේ වර්ණය වැඩි දියුණු කළ හැක.

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය ප්‍රකාශ වන්නේ,

(1) A සහ B පමණි. (2) B සහ C පමණි. (3) A සහ C පමණි.
(4) B සහ D පමණි. (5) C සහ D පමණි.

**47.** සතුන් පෝෂණය කිරීම සඳහා සුදුසු ඉහළම ගුණාත්මයෙන් යුත් ප්‍රෝටීන ප්‍රභවය

(1) සොයා අන්නය වේ. (2) පොල් පුන්නක්කු වේ. (3) මාලු අන්නය වේ.
(4) කරවල කුඩු වේ. (5) ලේ අන්නය වේ.

**48.** කිකිළි බිත්තර රක්කවනයක පවත්වා ගත යුතු යෝග්‍යතම උෂ්ණත්වය වන්නේ,

(1) 90 °F (32 °C) (2) 95 °F (35 °C) (3) 100 °F (38 °C)
(4) 105 °F (41 °C) (5) 110 °F (43 °C)

**49.** කෘත්‍රිම සිංචනය සඳහා ශුක්‍ර සැකසීමට පෙර ඇගයීම සිදු කළ යුතු ය. ශුක්‍ර ඇගයීම සහ තනුක කිරීම පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය පහත ඒවා අතුරෙන් තෝරන්න.

(1) ශුක්‍ර ඇගයීම සාමාන්‍යයෙන් සිදු කරන්නේ තනුක කිරීමෙන් අනතුරුව ය.
(2) ශුක්‍ර පරිමාව මැනීම, දෘශ්‍ය පරීක්ෂාවකි.
(3) අණ්වීක්ෂයක් මගින් පරීක්ෂා කර ශුක්‍රාණු සාන්ද්‍රණය නිර්ණය කිරීමට නොහැකි ය.
(4) වර්ණය සහ පරිමාව ශුක්‍රවල ගුණාත්මය නිර්ණය කරන සාධක වේ.
(5) ශුක්‍ර තනුක කිරීමෙන් පසුව නිපදවනු ලබන වඩි (doses) ගණන රඳා පවතිනුයේ ශුක්‍ර පරිමාව මත පමණි.

**50.** මස් සහ කිරි ශීතනය මගින් පරිරක්ෂණය කළ හැකි වන්නේ,

(1) පහළ උෂ්ණත්ව වලදී සියලුම ක්ෂුද්‍රජීවීන් විනාශ වන නිසා ය.
(2) ඒවා නරක්වීමට දායක වන ක්ෂුද්‍රජීවීන් අක්‍රිය වීම නිසා ය.
(3) පහළ උෂ්ණත්ව වලදී එන්සයිම ප්‍රතික්‍රියා නිශේධනය වන නිසා ය.
(4) ආහාර නරක්වීමට හේතුවන එන්සයිම විනාශ වන නිසා ය.
(5) පහළ උෂ්ණත්ව වලදී ඒවා නරක් වීමට දායක වන ක්ෂුද්‍රජීවීන් සහ එන්සයිම දෙවර්ගයම විනාශ වන නිසා ය.

* * *

EXAMMOOD.LK

EXAMMOOD.LK
EXAMMOOD.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

| | |
|---|---|
| **කෘෂි තාක්ෂණවේදය** | II |
| விவசாயத் தொழினுட்பவியல் | II |
| Agro Technology | II |

**18 S II**

**2018.08.16 / 1300 - 1610**

**පැය තුනයි**
*மூன்று மணித்தியாலம்*
*Three hours*

| | | |
|---|---|---|
| **අමතර කියවීම් කාලය** | - | **මිනිත්තු 10 යි** |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**විභාග අංකය :** ........................................

**උපදෙස් :**

✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **08**කින් සහ ප්‍රශ්න **10**කින් සමන්විත වේ.

✳ මෙම ප්‍රශ්න පත්‍රය **A, B** හා **C** යනුවෙන් කොටස් **තුනකින්** සමන්විත වන අතර කොටස් **තුනට ම** නියමිත කාලය **පැය තුනකි.**

**A කොටස – ව්‍යුහගත රචනා (පිටු අංක 2 - 7)**

✳ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.

✳ ඔබේ පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු **නො වන** බව ද සලකන්න.

**B කොටස සහ C කොටස – රචනා (පිටු අංක 8)**

✳ එක් එක් කොටසින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න.

✳ සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A, B** සහ **C** කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ **A** කොටස උඩින් තිබෙන පරිදි අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.

✳ ප්‍රශ්න පත්‍රයේ **B** හා **C** කොටස් පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| කොටස | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| C | 8 | |
| | 9 | |
| | 10 | |
| එකතුව | | |
| ප්‍රතිශතය | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

**සංකේත අංකය**

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| ලකුණු පරීක්ෂා කළේ | |
| අධීක්ෂණය කළේ | |

EXAMMOOD.LK
EXAMMOOD.LK

මේ තීරුවේ කිසිවක් නො ලියන්න.

**A කොටස - ව්‍යුහගත රචනා**

**සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.

(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය **10**කි.)

**1.** (A) පහත ක්‍රියාවන් සඳහා යොදාගැනෙන මෘදු තාක්ෂණයක් බැගින් සඳහන් කරන්න.

(1) ශරීර සුවතාවය : ..........

(2) රූපලාවන්‍යය: ..........

(B) පහත දැක්වෙන එක් එක් කාර්යයන් සඳහා උචිත මෘදුකාංගය හෝ මෘදුකාංග ආකාරය සඳහන් කරන්න.

| **කාර්යය** | **මෘදුකාංගය හෝ මෘදුකාංග ආකාරය** |
|---|---|
| (1) සේවක වාර්තා පවත්වාගැනීම | .......... |
| (2) ව්‍යාපාරික ලිපියක් ලිවීම | .......... |

(C) සරල කාබෝහයිඩ්‍රේට ප්‍රමාණය ඉක්මවා පරිභෝජනය, රුධිර සීනි මට්ටම ඉහළ නැංවීමට හේතු විය හැකි ය. රුධිරයේ අධික සීනි මට්ටමක් පැවතීම හා සම්බන්ධ සෞඛ්‍ය ගැටළු **දෙකක්** නම් කරන්න.

(1) ..........

(2) ..........

(D) ගෘහස්ථ මට්ටමේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමට යොදාගත හැකි ප්‍රවේශයන් **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........

(2) ..........

(E) භෞතික සහ ජෛව රසායනික සාධක හේතුවෙන් ආහාර නරක්වීමට ලක් විය හැකි ය.

(i) ආහාර නරක්වීමට හේතුවන ජෛව රසායනික සාධක **දෙකක්** නම් කරන්න.

(1) ..........

(2) ..........

(ii) ආහාර නරක්වීමට හේතුවන භෞතික සාධක **තුනක්** නම් කරන්න.

(1) ..........

(2) ..........

(3) ..........

(F) බෝගවල මනා වර්ධනයක් සඳහා පාංශු pH අගය වැදගත් සාධකයකි.

(i) උදාසීන පසක්, ආම්ලික පසක් බවට පත්වීම කෙරෙහි බලපාන කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........

(2) ..........

(ii) ජලජීවී වගාව කෙරෙහි ආම්ලික පසක් මගින් ඇති කරනු ලබන ගැටළු **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........

(2) ..........

(iii) ආම්ලික පස පුනරුත්ථාපනය කිරීම (reclamation) සඳහා යොදාගත හැකි ද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.

(1) ..........

(2) ..........

[තුන්වැනි පිටුව බලන්න.

EXAMMOOD.LK

මේ තීරයේ කිසිවක් නො ලියන්න.

3272

(G) පහත දැ අර්ථ දක්වන්න.

(i) බීජ සුප්තතාවය

........................................................................................................

........................................................................................................

(ii) ක්ෂුද්‍ර ප්‍රචාරණය

........................................................................................................

........................................................................................................

(iii) පාතෙනෝප්ලනය

........................................................................................................

........................................................................................................

(H) රයිසෝමයක ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(3) ........................................................................................................

**2.** (A) ඔසු උයනක් පවත්වා ගැනීම මගින් ඖෂධීය වටිනාකමකින් යුත් ශාකමය ද්‍රව්‍ය ලබාදීමට අමතරව වෙනත් ප්‍රයෝජන රාශියක් ලබාදෙයි.

(i) ඖෂධ උයනක් පවත්වා ගැනීමේ වෙනත් ප්‍රයෝජන **තුනක්** නම් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(3) ........................................................................................................

(ii) ඖෂධ උයන් තවාන් කළමනාකරණයේදී යොදාගන්නා වැදගත් නඩත්තු කටයුතු **තුනක්** නම් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(3) ........................................................................................................

(B) කොරල්පර යනු ඉතා ඉහළ විවිධත්වයකින් යුත් පරිසර පද්ධතිවලින් එකකි.

(i) ශ්‍රී ලංකාවේ කොරල්පර සුලභව හමුවන ස්ථාන **දෙකක්** නම් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(ii) කොරල්පරවල පැවැත්ම කෙරෙහි තර්ජනයක් වන ප්‍රධාන සාධක **දෙකක්** සඳහන් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(C) මානව වෛද්‍ය විද්‍යාවේදී නූතන ජෛව තාක්ෂණික උපක්‍රම බහුලව භාවිත වේ. එවැනි තාක්ෂණික උපක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................



EXAMMOOD.LK

මේ තීරයේ කිසිවක් නො ලියන්න.

(D) (i) පහත දැක්වෙන ව්‍යාපාර නිෂ්පාදන ඉලක්කගත ද නැතහොත් සේවා ඉලක්කගත දැයි සඳහන් කරන්න.

| | ව්‍යාපාරය | ව්‍යාපාරයේ ස්වභාවය |
|---|---|---|
| (1) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන 'හෙලබොජුන්' මධ්‍යස්ථාන | ........................................ ........................................ |
| (2) | ජාතික පශු සම්පත් මණ්ඩලයේ රිදියගම කිරිගව ගොවිපොළ | ........................................ ........................................ |
| (3) | මිල්කෝ (MILCO) පුද්ගලික ආයතනය | ........................................ ........................................ |

(ii) ගොවියකු රුපියල් මිලියන 5 ක මුදලක් ආයෝජනය කරමින් කිරිදෙනුන් 10 කින් සමන්විත ගොවිපොළක් ස්ථාපනය කරන ලදී. ඔහු සත්ත්ව ආහාර සඳහා රුපියල් 1500 ක මුදලක් ද වෙනත් සැපයුම් සඳහා රුපියල් 500 ක් ද දිනපතා වියදම් කරන ලදී. ගොවිපොලේ දෛනික සාමාන්‍ය කිරි නිෂ්පාදනය ලීටර 100 ක් වන අතර කිරි ලීටරයක ගොවිපොළ මිල රුපියල් 70 කි. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) ගොවිපොලේ පුනරාවර්තන වියදම = දිනකට රුපියල් ........................................

(2) ව්‍යාපාරයේ දළ ලාභය = දිනකට රුපියල් ........................................

(E) දේශීය තත්ත්ව යටතේදී ගබඩා කළ ධාන්‍යවල පසු අස්වනු හානි සඳහා වන ප්‍රධාන හේතු **දෙකක්** සඳහන් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(F) ශ්‍රී ලංකාවේ ධාන්‍ය ගබඩා කරන සාම්ප්‍රදායික ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(G) කෘෂිකර්මාන්තයේදී ශුද්ධ හරිතාගාර වායු උත්පාදනය වැඩිකරන, තාක්ෂණික මැදිහත්වීම් **දෙකක්** නම් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(H) නාගරික ඝන අපද්‍රව්‍ය, ශ්‍රී ලංකාවේ දැවෙන පාරිසරික ගැටළුවක් බවට පත්වී ඇත.

නාගරික ඝන අපද්‍රව්‍ය මගින් ඇති කෙරෙන පාරිසරික බලපෑම් **දෙකක්** සඳහන් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

EXAMMOOD.LK EXAMMOOD.LK

මේ තීරයේ කිසිවක් නො ලියන්න.

**3.** (A) පහත දැක්වෙන කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සඳහා භාවිත වන සාම්ප්‍රදායික උචිත තාක්ෂණයක් බැගින් සඳහන් කරන්න.

| **කෘෂිකාර්මික ක්‍රියාකාරකම** | **සාම්ප්‍රදායික උචිත තාක්ෂණය** |
|---|---|
| (1) කෘමි පළිබෝධ පාලනය | ................................................ |
| (2) ජල සම්පාදනය | ................................................ |

(B) බෝග වගාව සහ කළමනාකරණය සඳහා, පහත සඳහන් උපකරණ භාවිත වන බෝගයක් බැගින් නම් කරන්න.

| **උපකරණය** | **බෝගය** |
|---|---|
| (1) ජෝන් පුල්ලේ සීඩරය | ................................................ |
| (2) ඩ්‍රම් සීඩරය | ................................................ |
| (3) නැප්සැක් ඉසිනය | ................................................ |
| (4) කෝනෝ වීඩරය | ................................................ |

(C) පාංශු හායනය වේගවත් කරන රසායනික සාධක **දෙක** සඳහන් කරන්න.

(1) ................................................

(2) ................................................

(D) බෑවුම් ඉඩම්වල පාංශු සංරක්ෂණය සඳහා සුදුසු යාන්ත්‍රික පාංශු සංරක්ෂණ ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(1) ................................................

(2) ................................................

(E) බෝගයකට පොස්පරස් සපයන ප්‍රධාන අකාබනික ප්‍රභවයන් **දෙකක්** ලැයිස්තුගත කරන්න.

(1) ................................................

(2) ................................................

(F) ශාකයකට නයිට්‍රජන් ලබාගත හැකි ආකාර **දෙකක්** නම් කරන්න.

(1) ................................................

(2) ................................................

(G) බෝගයකට පොහොර යෙදීමේ ක්‍රමය තීරණය කරනු ලබන සාධක **දෙකක්** සඳහන් කරන්න.

(1) ................................................

(2) ................................................

(H) ක්ෂේත්‍රයේ සිටුවීම සඳහා පැළ ලබාගැනීමට යොදාගනු ලබන පටක රෝපණ තාක්ෂණ ක්‍රම **දෙකක්** ලැයිස්තුගත කරන්න.

(1) ................................................

(2) ................................................

(I) ආරක්ෂිත ගෘහ තුළ බෝග වගාවේදී කෘමි පළිබෝධ හානිය පාලනය කිරීමට යොදාගනු ලබන ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(1) ................................................

(2) ................................................

EXAMMOOD.LK

EXAMMOOD.LK

මේ තීරුවේ කිසිවක් නො ලියන්න.

(J) ශ්‍රී ලංකාවේ වී වගාවේදී හමුවන කෘමීන් නොවන පළිබෝධකයින් **දෙදෙනෙක්** නම් කරන්න.

(1) ..........

(2) ..........

(K) ශ්‍රී ලංකාවේ වී වගාවේදී කෘමි පළිබෝධකයින් පාලනය කිරීමට යොදාගනු ලබන පරිසර හිතකාමී තාක්ෂණ ක්‍රම **තුනක්** නම් කරන්න.

(1) ..........

(2) ..........

(3) ..........

**4.** (A) කෘෂි කර්මාන්තයේදී රෝග පාලනයට යොදාගන්නා ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම **දෙකක්** නම් කරන්න.

(1) ..........

(2) ..........

(B) අපනයන වෙළඳපොළ අරමුණු කරගනිමින් රෝස මල් නෙළීමේදී සැලකිය යුතු සාධක **දෙකක්** ලැයිස්තුගත කරන්න.

(1) ..........

(2) ..........

(C) හොඳ ගුණාත්මයෙන් යුත් තෘණ සයිලේජවල භෞතික ගති ලක්ෂණ **දෙකක්** ලැයිස්තුගත කරන්න.

(1) ..........

(2) ..........

(D) පහත සඳහන් සත්ත්ව ආහාරවල නිර්දේශිත දළ ප්‍රෝටීන මට්ටම සඳහන් කරන්න.

(1) බ්‍රොයිලර් ආරම්භක සළාකය ..........

(2) කුකුල් පැටවුන්ගේ සළාකය ..........

(E) රක්කවීම සඳහා බිත්තර තේරීමේදී පහත සඳහන් බිත්තර ප්‍රතික්ෂේප කිරීමට එක් හේතුවක් බැගින් සඳහන් කරන්න.

(1) කටුව පිපිරුණු බිත්තර ..........

(2) ඉතා කුඩා බිත්තර ..........

(F) ගවයින්ගේ ශුක්‍ර තනුක කිරීම සඳහා යොදාගන්නා තනුක කාරක **දෙකක්** නම් කරන්න.

(1) ..........

(2) ..........

(G) විජලනය මගින් මස් පරිරක්ෂණය කළ හැකි ය. මස් විජලනය කළ හැකි ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........

(2) ..........

(H) (i) ගොඩබිම් වගාවේ පාංශු සුසංහනය නිසා ඇතිවන අහිතකර බලපෑම් **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........

(2) ..........



EXAMMOOD.LK EXAMMOOD.LK

මේ තීරයේ කිසිවක් නො ලියන්න.

(ii) ජලවහනය දුර්වල පසක වැඩෙන ශාකයක දැකිය හැකි ලක්ෂණ **තුනක්** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(I) (i) පොලිතින් ගෘහයක අභ්‍යන්තර උෂ්ණත්වය පාලනය කිරීම සඳහා යොදාගත හැකි ක්‍රම **දෙකක්** ලියන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(ii) උද්‍යාන අලංකරණයේදී පහත සඳහන් මෘදු අංග සඳහා සුදුසු ශාක වර්ගය/ප්‍රභේදය බැගින් සඳහන් කරන්න.

| **මෘදු අංගය** | **සුදුසු ශාක වර්ගය/ප්‍රභේදය** |
|---|---|
| (1) බෝදර | .................................................. |
| (2) තනි ශාක | .................................................. |
| (3) මල් පාත්ති | .................................................. |
| (4) තෘණ පිටි | .................................................. |

* *

EXAMMOOD.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

කෘෂි තාක්ෂණවේදය II
விவசாயத் தொழினுட்பவியல் II
Agro Technology II

**18 S II**

## රචනා

* **B** සහ **C** යන කොටස්වලින් එක් කොටසකින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න. (එක් ප්‍රශ්නයකට ලකුණු **15** බැගින් ලැබේ.)

### B කොටස

**5.** (i) ජාතික වනජීවී අභයභූමි කළමනාකරණයේදී තාක්ෂණයේ යොදාගැනීම් පිළිබඳ රචනාවක් ලියන්න.

(ii) උපරිම ලාභ ලැබීමේ අරමුණින් ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී තොරතුරු තාක්ෂණය යොදාගැනීමේ වැදගත්කම විස්තර කරන්න.

(iii) ජීවන රටාවේ සිදු වූ වෙනස්කම් නිසා ශ්‍රී ලාංකිකයන්ගේ සාම්ප්‍රදායික ආහාර පුරුදුවල සිදු වී ඇති වෙනස්කම් විස්තර කරන්න.

**6.** (i) බෝග නිෂ්පාදනය කෙරෙහි පරිසර උෂ්ණත්වයේ බලපෑම විස්තර කරන්න.

(ii) සාර්ථක ව්‍යවසායකයකුට සිය ව්‍යාපාරය තිරසාරව කර ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(iii) ජලජ පරිසර පද්ධතියක තිරසාර බව කෙරෙහි මානව ක්‍රියාකාරකම්වල බලපෑම විස්තර කරන්න.

**7.** (i) ශ්‍රී ලංකාවේ, තෝරාගත් පලතුරු බෝගයක ගොවිපොළේ සිට පාරිභෝගිකයා අතට පත්වීම දක්වා සිදුවන පසු අස්වනු හානි සහ පසු අස්වනු හානි අවම කිරීමට යොදාගන්නා ක්‍රියාමාර්ග විස්තර කරන්න.

(ii) තොරතුරු තාක්ෂණය භාවිතයේදී සදාචාරාත්මක හැසිරීමේ (Ethical Conduct) වැදගත්කම විස්තර කරන්න.

(iii) ශ්‍රී ලංකාවේ එදිනෙදා ජීවිතයේ නිපදවෙන අපද්‍රව්‍ය කළමනාකරණයේදී 3R සංකල්පය යොදාගැනීම උදාහරණ සහිතව විස්තර කරන්න.

### C කොටස

**8.** (i) ඉහළ බෝග අස්වැන්නක් ලබාගැනීම සඳහා ශාක පෝෂක තුලිතව ලබාදීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ii) කෘෂි කර්මාන්තයේදී පළිබෝධනාශක අවභාවිතයේ බලපෑම පැහැදිලි කරන්න.

(iii) ශ්‍රී ලංකාවේ කැපූ මල් කර්මාන්තය වැඩිදියුණු කිරීමේ විභවය විස්තර කරන්න.

**9.** (i) සුදුසු උදාහරණ දක්වමින් කෘෂිකාර්මික ඉඩම්වල පාංශු වාතනය වැඩිදියුණු කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ii) විවිධ ක්‍රියාකාරකම් සඳහා හේතු දක්වමින්, හොඳ ගුණාත්මයෙන් යුත් තෘණ සයිලේජ නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

(iii) සාර්ථක බිත්තර රක්කවීමක් සඳහා අවශ්‍ය විවිධ තත්ත්වයන් විස්තර කරන්න.

**10.** (i) හරිත විප්ලවයේ ඍණාත්මක බලපෑම් විස්තර කරන්න.

(ii) පාංශු සංරක්ෂණය සඳහා භාවිත වන SALT ක්‍රමය විස්තර කරන්න.

(iii) කුඩා පරිමාණ කෘෂි නිෂ්පාදන පද්ධතියකට සුදුසු වර්ෂා ජලය එකරැස් කිරීමේ පද්ධතියක ඇති ප්‍රධාන සංරචක විස්තර කරන්න.

* * *

EXAMMOOD.LK